



චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




බහුදින යාත්‍රා සදහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබද පුරෝකථනය

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2024-09-09**

| අක්ෂාංශ அகலாங்கு | | | දේශාංශ நெட்டாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 9 | 21 | N | 85 | 18 | E | 22 |
| 7 | 24 | N | 85 | 51 | E | 38 |
| 6 | 3 | N | 61 | 37 | E | 58 |
| 6 | 14 | N | 60 | 32 | E | 59 |
| 7 | 5 | N | 60 | 25 | E | 55 |
| 9 | 18 | N | 63 | 53 | E | 54 |
| 8 | 14 | N | 64 | 29 | E | 56 |
| 7 | 22 | N | 64 | 1 | E | 65 |
| 7 | 34 | N | 64 | 46 | E | 55 |
| -8 | 30 | S | 60 | 23 | E | 45 |
| -4 | 33 | S | 64 | 36 | E | 39 |
| -4 | 17 | S | 65 | 28 | E | 31 |

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය
## උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශ සඳහා
## (2024 සැප්තැම්බර් මස 09 දින පෙ.ව. 07.00 ට ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)

### දිවයින වටා වන මුහුදු ප්‍රදේශ

| |
|---|
| **වැසි තත්ත්වය:** |
| පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |
| **සුළඟ:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.<br>**මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා සහ කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (60-65) දක්වා වැඩි විය හැක.**<br>ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය දක්වා සහ පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (50-55)** දක්වා වැඩි විය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| **මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා සහ කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු වේ.**<br>ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය දක්වා සහ පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

### බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**වයඹ සහ ඊට යාබද බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය, ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ඊයේ (සැප්තැම්බර් 8) 1800UTC වනවිට උතුරු අක්ෂාංශ 18.9ත් නැගෙනහිර දේශාංශ 86.3ත් ආශ්‍රිතව පැවතිණි. මෙම පද්ධතිය ආසන්නව වයඹ දෙසට ගමන් කරමින් අද (සැප්තැම්බර් 9) 0600UTC ට පමණ ඉන්දියාවේ ඔඩිෂා වෙරල හරහා ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.**

**එම නිසා උතුරු අක්ෂාංශ 13 ත් 20 ත් සහ නැගෙනහිර දේශාංශ 83 සහ 95 ත් අතර මුහුදු ප්‍රදේශවල ඉතා තද සුළං (පැ.කි.මී. 70-75) පැවතිය හැකි අතර මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක. නැවත දැනුම්දෙන තුරු ඉහත මුහුදු ප්‍රදේශවල යාත්‍රා නොකරන ලෙස නාවික සහ ධීවර ප්‍රජාවන්ට දැනුම් දෙනු ලැබේ. මෙම මුහුදු ප්‍රදේශවල ධීවර හා නාවික කටයුතුවල යෙදී සිටින්නන්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**

13N-20N, 90E-100E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

**13N - 20N, 80E-100E : නිරිත දෙසින් / පැ.කි.මී. (40-50); විටින් විට පැ.කි.මී. (70-75) දක්වා.**
**05N - 13N, 80E-100E : නිරිත දෙසින් / පැ.කි.මී. (35-45); විටින් විට පැ.කි.මී. (60-75) දක්වා.**
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව /පැ.කි.මී. (25-35).

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**මුහුදේ ස්වභාවය:**

**13N - 20N, 80E-100E :** රළු, විටින් විට ඉතා රළු
05N - 13N, 80E-100E : තරමක් රළු, විටින් විට රළු හෝ ඉතා රළු
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

05N - 10N, 70E-80E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

10N - 18N, 60E-75E : නිරිත සිට බස්නාහිර දක්වා වන දිශාවලින් /පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී.(50-60) දක්වා.
05N - 10N, 60E-80E : බස්නාහිර දෙසින් /පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී.(50-55) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව /පැ.කි.මී. (25-35).

**මුහුදේ ස්වභාවය:**

10N - 18N, 60E-75E : තරමක් රළු සිට රළු.
05N - 10N, 60E-80E : තරමක් රළු සිට රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

**කාලගුණික තත්ත්වය**

EQ-05S, 85E-100E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
05S-10S, 70E-80E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

04S-10S, 80E-100E : ගිණිකොන දෙසින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : ගිණිකොන දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව /පැ.කි.මී. (30-40).

**මුහුදේ ස්වභාවය:**

04S-10S, 80E-100E : තරමක් රළු, විටින් විට රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.